# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1681/33 - 2010 නොවැම්බර් 24 වැනි බදාදා - 2010.11.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 11 දරන මුදල් පනත**

2 වැනි වගන්තිය යටතේ නියෝගය

2009 අංක 13 දරන මුදල් (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද 2002 අංක 11 දරන මුදල් පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නිවේදනය මගින් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 30.01, 30.02, 30.03, 30.04, 30.06, යටතේ ආනයනය කරනු ලබන ඖෂධ නිෂ්පාදන, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 27.14 සහ සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 2713.20 යටතේ වන බිටුමින්, සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 8805.21 සහ 8805.29 යටතේ වන ගුවන්යානා සමමිතිකයන් සහ කොටස්, සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 8803.30 යටතේ වන ගුවන්යානා හෝ හෙලිකොප්ටර් යානා සඳහා වන කොටස්, සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 8411.91 යටතේ වන ටර්බෝ ජෙට් හෝ ටර්බෝ ප්‍රොපෙලර්ස් ආනයනය කිරීම 2010 නොවැම්බර් මස 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ගෙවීමෙන් නිදහස් කරනු ලබන බව ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

12-702/1

---

නිවැරදි කිරීමයි

**2006 අංක 11 දරන මුදල් පනත**

2 (1) (ආ) (i) සහ (ii) වගන්තිය යටතේ නියමය

2010 නොවැම්බර් මස 19 වැනි දින අංක 1680/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය හි දැන්වීම් අංක 12-414 දරන දැන්වීමේ අවසාන පේලිය "කරනු ලැබූ නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ." යනුවෙන් සඳහන් වී ඇත. එය, "කරනු ලැබූ නියමය 2011 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ." යනුවෙන් නිවැරදි විය යුතු ය.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2010 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති ලේකම් කාර්යාලයේ දී ය.

12-702/2

1A - G 13869— 2,130 (2010/11)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.